රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක : 03/2004

මගේ අංකය : ආ/7/5/1/4
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2004.06.04 වැනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත්සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

ඩෙංගු වසංගතය මර්දනය කිරීම

ඩෙංගු වසංගතය තුරන් කරලීමේ ජාතික වැඩ සටහනේ පියවරක් ලෙස සතිපතා සෑම බ්‍රහස්පතින්ද දිනකම උදේ 9.00 සිට 10.00 අතර කාලය තුළ රාජ්‍ය ආයතනවල බිම් සහ ඒ අවට ස්ථාන දැඩි ලෙස පිරිසිදු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබ ඇත.

02. මෙහි දී මදුරුවන් බෝවන තැන් සොයාබලා එවැනි තැන් ඉතා පිරිසිදුව සහ තෙත් රහිතව තබාගැනීමට පියවර ගතයුතු වේ. තම අවට පරිසරය ඉතා පිරිසිදු තත්ත්වයෙන් පවත්වාගෙනයෑමේ දැඩි අවශ්‍යතාවය පිළිබඳ ආයතනවල කාර්ය මණ්ඩල ද දැනුවත් කළයුතු වේ.

03. සෞඛ්‍ය, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශය විසින් ජනමාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති පරිදි ඒ ඒ රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල, වෘත්තිය සමිති, සුබසාධක සමිති සහ මහජනතාවගේ සහයෝගය ඇතිව මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කළයුතුය. මෙය සාර්ථක කරලීම සඳහා සුදුසු පරිදි ක්‍රියාකාරී කමිටු ද පිහිටුවිය හැකිය.

04. මෙම කාර්යය වෙනුවෙන් වැඩිදුරටත් අවශ්‍ය උපදෙස් සහ සහාය ප්‍රදේශයේ සෞඛ්‍ය බලධාරීන්ගෙන් සහ පළාත් පාලන ආයතනවලින් ද ලබාගැනීමට කරුණාකර පියවර ගන්න.



එස්.සී. මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය